සැ. *යු.* -මෙවර පළවන ගැසට් පත්‍රයේ V කොටසේ 2004 වර්ෂයේ ජනවාරි-මාර්තු කාර්තුවට අදාලව, මුද්‍රණ ශිල්පීන්ගේ හා ප්‍රකාශකයින්ගේ ආඥාපනත යටතේ ලියාපදිංචි වූ පොත් නාමවලියක් ඉංග්‍රීසි භාෂාවෙන් පළවේ.

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අංක 1,545 - 2008 අප්‍රේල් මස 11 වැනි සිකුරාදා - 2008.04.11**

(ආණ්ඩුවේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

## I වැනි කොටස : I වැනි ඡේදය - සාමාන්‍ය

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙන පිටු අංක යොදා ඇත.)

| | පිටුව |
|---|---|
| ජනාධිපතිතුමාණන් විසින් කරන ලද ප්‍රකාශන ආදිය | — |
| ජනාධිපතිතුමාණන් විසින් කරන ලද පත්කිරීම් ආදිය ... | 322 |
| අමාත්‍ය මණ්ඩලය විසින් කරන ලද පත්කිරීම් ආදිය ... | — |
| රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් කරන ලද පත්කිරීම් ආදිය | — |
| අධිකරණ සේවා කොමිෂන් සභාව විසින් කරන ලද පත්කිරීම් ආදිය | — |
| වෙනත් පත්කිරීම් ආදිය ... ... ... ... | — |
| රෙජිස්ට්‍රාර්වරුන්ගේ පත්කිරීම් ආදිය ... ... ... | — |
| ආණ්ඩුවේ නිවේදන ... ... ... | 323 |
| මිල පාලන දැන්වීම් ... ... ... | — |
| ශ්‍රී ලංකා මහ බැංකුවේ දැන්වීම් ... ... ... | — |
| ශ්‍රී ලංකාණ්ඩුවේ ගිණුම් ප්‍රකාශන ... ... ... | — |
| ආදායම් හා වියදම් පිළිබඳ වාර්තා ... ... ... | — |
| විවිධ දෙපාර්තමේන්තු දැන්වීම් ... ... ... | 324 |
| නැවියන්ට දැන්වීම් ... ... ... | — |
| සුරාබදු ආඥාපනත පිළිබඳ දැන්වීම් ... ... ... | — |

සැ.යු.- (i) වාරියපොල රාජමහා විහාර සංවර්ධන සභාව (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත 2008 ජනවාරි 25 වැනි දින *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනජරයේ ගැසට් පත්‍රයේ* II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පලකරන ලදී.

(ii) එකතු කළ අගය මත බදු(සංශෝධන) පනත් කෙටුම්පත, 2008 ජනවාරි 25 වැනි දින *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ* II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පලකරන ලදී.

(iii) ක්‍රමෝපාය සංවර්ධන ව්‍යාපෘති පනත් කෙටුම්පත, 2008 ජනවාරි 25 වැනි දින *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ* II කොටසේ අතිරේකයක් වශයෙන් පලකරන ලදී.

**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

### වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයෙහි* සෑම කොටසකටම අග පිටුවෙහි සෑම මාසයකම මුල් සතියේ දී පළ කරනු ලබන *ගැසට්* නිවේදන බාර ගන්නා අවසාන දිනය සහ වේලාව සඳහන් නිවේදන කෙරෙහි ඔබගේ අවධානය මින් යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* සෑම කොටසකම පළකළ යුතු *ගැසට්* නිවේදන භාර ගන්නා වේලාව, *ගැසට් පත්‍රය* ප්‍රසිද්ධ කරනු ලබන සිකුරාදා දිනට සති දෙකකට පෙර එළඹෙන සිකුරාදා දිනයෙහි දහවල් 12 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, ටෙන්ඩර් දැන්වීම්, වෙන්දේසි පිළිබඳ දැන්වීම් යනාදියෙහි සඳහන් කරනු ලබන අවසාන දිනය සහ වේලාවන් ඊට අනුරූපව - එනම් දැන්වීම්, රජයේ මුද්‍රණාලයට එවන සහ එම දැන්වීම්, පළ කරන දින අතර සෑහෙන කාල වේලාවක් දෙමින් එම දැන්වීම්වල සඳහන් කරුණු කෙරෙහි උනන්දුවක් දක්වන සෑම කෙනෙකුටම ප්‍රයෝජනවත් වන පරිදි ඊට සහභාගිවීමට ඉඩ ප්‍රස්ථාවක් සැළසෙන සේ සකස් කරන මෙන් සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා, මණ්ඩල යනාදියෙන් මින් ඉල්ලා සිටිනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම පිණිස එවන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* ප්‍රසිද්ධ කරනු ලබන දිනට සති දෙකකට පෙර - එනම් 2008 අප්‍රේල් මස 18 වැනි දින පළ කෙරෙන *ගැසට් පත්‍රයට* යා යුතු දැන්වීම් 2008 අප්‍රේල් මස 04 වැනි දින දහවල් 12.00 ට හෝ ඊට පෙර රජයේ මුද්‍රණාලයට ලැබෙන සේ එවිය යුතුය.

**ලක්ෂමන් ගුණවර්ධන,**
ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති.

2008 ජනවාරි මස 01 වැනි දින,
ආණ්ඩුවේ මුද්‍රණ දෙපාර්තමේන්තුව,
කොළඹ 08.

# ජනාධිපතිතුමාණන් විසින් කරන ලද පත්කිරීම් ආදිය

2008 අංක 194

DRF/21/RECT/2559.

**ශ්‍රී ලංකා යුද්ධ හමුදාව - ස්ථිර බල හමුදාව**

අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කරන ලද නිළ ස්ථිර කිරීමක් සහ විශ්‍රාම ගැනීමක්

**නිල ස්ථිර කිරීමක්**

පහත නම සඳහන් නිලධාරිය 2007 ජුනි මස 30 වැනි දින සිට මේජර් නිලයේ ස්ථිර කිරීම අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කර ඇත.

කපිතන් (තාවකාලික මේජර්) දේව් චන්දිම හේවාවිතාන ශ්‍රීලයුවෛබ (නි/61861)

**විශ්‍රාම ගැනීම**

පහත නම සඳහන් නිලධාරියා 2007 ජූලි මස 01 වන දින සිට ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ ස්ථිර බල හමුදාවෙන් විශ්‍රාම ගැනීම අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කර ඇත.

මේජර් දේව් චන්දිම හේවාවිතාන ශ්‍රීලයුවෛබ (නි/61861)

අතිගරු ජනාධිපති උතුමාණන්ගේ අණ පරිදි,

ගෝඨාභය රාජපක්ෂ ආර්ඩබ්පී ආර්එස්පී පීඑස්සී
ලේකම්
රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව,
නීතිය හා සාමය පිළිබඳ අමාත්‍යාංශය

2007 ජූලි මස 23 වැනි දින,
කොළඹ දී ය.

04-207

2008 අංක 195

**ශ්‍රී ලංකා යුද්ධ හමුදාව - ස්ථිර බල හමුදාව**

අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කරන ලද විශ්‍රාම ගැනීමක්

පහත නම සඳහන් නිලධාරියා 2007 අගෝස්තු මස 31 වැනි දින සිට ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ ස්ථිර බල හමුදාවෙන් විශ්‍රාම ගැනීම අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කර ඇත.

මේජර් කුමාරපති විතානලාගේ දොන් උෂාන්ත් සුපුන් පෙරේරා ආර්එස්පී ශ්‍රීලංසංබ (නි/61068)

අතිගරු ජනාධිපති උතුමාණන්ගේ අණ පරිදි,

ගෝඨාභය රාජපක්ෂ ආර්ඩබ්පී ආර්එස්පී පීඑස්සී,
ලේකම්,
රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව,
නීතිය හා සාමය පිළිබඳ අමාත්‍යාංශය

2007 ජූලි මස 23 වැනි දින,
කොළඹ දී ය.

04-206

2008 අංක 196

DRF/21/RECT/2560.

**ශ්‍රී ලංකා යුද්ධ හමුදාව - ස්ථිර බල හමුදාව**

අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කරන ලද විශ්‍රාම ගැනීමක්

පහත නම සඳහන් නිලධාරියා 2007 අගෝස්තු මස 11 වැනි දින සිට ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ ස්ථිර බල හමුදාවෙන් විශ්‍රාම ගැනීම අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කර ඇත.

කපිතන් වන්නි ආරච්චිගේ ලක්ෂ්මන් ප්‍රියන්ත ගරෙ (නි/63216)

අතිගරු ජනාධිපති උතුමාණන්ගේ අණ පරිදි,

ගෝඨාභය රාජපක්ෂ ආර්ඩබ්පී ආර්එස්පී පීඑස්සී,
ලේකම්,
රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව,
නීතිය හා සාමය පිළිබඳ අමාත්‍යාංශය

2007 ජූලි මස 26 වැනි දින
කොළඹ දී ය.

04-208

2008 අංක 197

**ශ්‍රී ලංකා යුද්ධ හමුදාව - ස්වේච්ඡා බලසේනාව**

අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කරන ලද විශ්‍රාම ගැන්වීමක්

පහත නම සඳහන් ජ්‍යෙෂ්ඨ නිලධාරි 2007 ජූලි මස 01 දින සිට ශ්‍රී ලංකා යුද්ධ හමුදා ස්වේච්ඡා බලසේනාවෙන් විශ්‍රාම ගැනීම අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කරනු ලැබ ඇත.

කර්නල් වර්ණකුල ආරච්චිගේ සිරිලාල් දයන්ත ප්‍රනාන්දු (නි/2053)

අතිගරු ජනාධිපති උතුමාණන්ගේ අණ පරිදි,

ගෝඨාභය රාජපක්ෂ ආර්ඩබ්පී ආර්එස්පී පීඑස්සී
ලේකම්
රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව,
නීතිය හා සාමය පිළිබඳ අමාත්‍යාංශය

2007 ජුනි මස 20 වැනි දින,
කොළඹ දී ය.

04-205/1

---

2008 අංක 198

**ශ්‍රී ලංකා යුද්ධ හමුදාව - ස්වේච්ඡා බලසේනාව**

අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කරන ලද විශ්‍රාම ගැන්වීමක්

පහත නම සඳහන් ජ්‍යෙෂ්ඨ නිලධාරී 2007 ජූලි මස 01 දින සිට ශ්‍රී ලංකා යුද්ධ හමුදා ස්වේච්ඡා බලසේනාවෙන් විශ්‍රාම ගැන්වීම අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කරනු ලැබ ඇත.

මේජර් ජෙනරල් වරකාපිටිය අබේකෝන්ගේ දොන් සුනිල් සිල්වා (නි/1956)

අතිගරු ජනාධිපති උතුමාණන්ගේ අණ පරිදි,

ගෝඨාභය රාජපක්ෂ ආර්ඩබ්පී ආර්එස්පී පීඑස්සී
ලේකම්
රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව,
නීතිය හා සාමය පිළිබඳ අමාත්‍යාංශය

2007 මැයි මස 07 වැනි දින
කොළඹ දී ය.

04-205/2

2008 අංක 199

DVF/RECT/22(VII)AY.

**ශ්‍රී ලංකා යුද්ධ හමුදාව - ස්වේච්ඡා බලසේනාව**

අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කරන ලද නිල ස්ථිර කිරීමක් සහ විශ්‍රාම ගැන්වීමක්

**නිල ස්ථිර කිරීම**

පහත නම සඳහන් නිලධාරී 2007 අගෝස්තු මස 31 වන දින සිට මේජර් නිලයේ ස්ථිර කිරීම අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කර ඇත.

කපිතාන් (තාවකාලික මේජර්) වීරකෝන් මුදියන්සේලාගේ මහින්දසේන විපාරෙ (නි/3391)

**විශ්‍රාම ගැන්වීම**

පහත නම සඳහන් නිලධාරී 2007 සැප්තැම්බර් මස 01 වන දින සිට ශ්‍රී ලංකා යුද හමුදා ස්වේච්ඡා බළසේනාවෙන් විශ්‍රාම ගැන්වීම අතිගරු ජනාධිපති උතුමානන් විසින් අනුමත කර ඇත.

මේජර් වීරකෝන් මුදියන්සේලාගේ මහින්දසේන විපාරෙ (නි/3391)

අතිගරු ජනාධිපති උතුමාණන්ගේ අණ පරිදි,

ගෝඨාභය රාජපක්ෂ ආර්ඩබ්පී ආර්එස්පී පීඑස්සී,
ලේකම්,
රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව,
නීතිය හා සාමය පිළිබඳ අමාත්‍යාංශය.

2007 ජුනි මස 27 වැනි දින,
කොළඹ දී ය.

04-204

---

# ආණ්ඩුවේ නිවේදන

**වන්දනා ආඥාපනත**

ගොඩපිටිය මුස්ලිම් උත්සවය - 2008

මාතර දිස්ත්‍රික්කයේ අතුරලිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ගොඩපිටිය පෝරුවේ (අකුරැස්ස - ගොඩපිටිය) "මොහියදීන් මුස්ලිම් දේවස්ථානයේ" වාර්ෂික ආගමික උත්සවය 2008 අප්‍රේල් 23 දින ආරම්භ වී 2008 මැයි 04 වන දින අවසන් කරන බව (175 අධිකාරිය) වන්දනා ආඥාපනත යටතේ සකස් කර, 1954 ජනවාරි මස 08 වන දින අංක 10630 දරන ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රයේ පළ කරන ලද රෙගුලාසිවල 3 වන වගන්තිය යටතේ මෙයින් දැනුම් දෙමි.

1954 ජනවාරි මස 08 වන දින අංක 10630 දරන ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රයේ පළ කරන ලද රෙගුලාසි ඉහත පැවැත්වෙන කාලය තුළ දී එකී රෙගුලාසි වල සඳහන් එහිම උප ඡේදයෙන් විස්තර වන "කඳවුර තුළ" ක්‍රියාත්මක වේ.

අයි. එස්. සමරකෝන්,
ප්‍රාදේශීය ලේකම්,
අතුරලිය.

2008 මාර්තු මස 26 වැනි දින,
අතුරලිය ප්‍රාදේශීය මහ ලේකම් කාර්යාලයේ දී ය.

04-316

# විවිධ දෙපාර්තමේන්තු දැන්වීම්

එන්(ඒ)125.

**2007 අංක 07 දරන සමාගම් පනත**

394(3) වගන්තිය යටතේ "ඉන්ටර් කල්ට්" හි නම කපා හැරීමේ දැන්වීම

1982 අංක 17 දරන සමාගම් පනතේ විධිවිධාන යටතේ 1989.02.28 දින සංස්ථාපිත සමාගමක් වන ඉන්ටර් කල්ට් ව්‍යාපාරික කටයුතුවල නිරත නොවන බව නැතහොත් ක්‍රියා විරහිත වී ඇති බව විශ්වාස කිරීමට ප්‍රමාණවත් හේතුන් තිබෙන හෙයින්,

එසේ නොකිරීමට හේතු නොදැක්වුවහොත්, අද දින සිට තෙමසක් ඉකුත්වූ විට, ඉන්ටර් කල්ට් නම, මෙම කාර්යාලයේ තිබෙන සමාගම් රෙජිස්ටරයෙන් කපා හරින බවත්, සමාගම විසුරුවා හරින බවත්, සමාගම් රෙජිස්ට්‍රාර් ජනරාල් ඩයස් කරුණාරත්න හෙට්ටිආරච්චි වන මම 2007 අංක 07 දරන සමාගම් පනතේ 394(3) වැනි වගන්තිය යටතේ මෙයින් දැනුම් දෙමි.

ඩයස් කරුණාරත්න හෙට්ටිආරච්චි,
සමාගම් රෙජිස්ටාර් ජනරාල්.

2008 මාර්තු මස 17 වැනි දින,
කොළඹ 10,
සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුවේ දී ය.

04-222

---

**ඩීඑෆ්සීසී බැංකුව**

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 04 වන වගන්තිය ප්‍රකාර (ලංකා සංවර්ධන මුදල් සංස්ථාව යනුවෙන් කලින් හැඳින්වුනු) ඩීඑෆ්සීසී බැංකුව විසින් සම්මත කරගන්නා ලද යෝජනා සම්මතය පිළිබඳ දැන්වීම

ඩීඑෆ්සීසී බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් මෙහි පහත දැක්වෙන යෝජනා සම්මතය ඒකච්ඡන්දයෙන් සම්මත කර ගන්නා ලද බව 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 8 වන වගන්තියට අනුකූලව මෙයින් දැනුම් දෙනු ලැබේ.

**අධ්‍යක්ෂ මණ්ඩල යෝජනා සම්මතය**

ලංකා සංවර්ධන මුදල් සංස්ථාව යනුවෙන් කලින් හැඳින්වුණු ඩීඑෆ්සීසී බැංකුව නමට කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් එස්. එම්. ගුණරත්න විසින් ලියා සහතික කරන ලද අංක 1370 හා 1601 සහ පිළිවෙළින් 2003.12.29 හා 2005.05.09 දින දරන උකස් බැඳුම්කරය මත අයවිය යුතු මුදල් ගෙවීම "ත්‍රී ස්ටාර් ෆාම්ස් " යන නාමය අභිධානය සහ ආයතනය යටතේ හවුල් ව්‍යාපාරයක් ලෙස පිළියන්දල ව්‍යාපාරය කරගෙන යන පිළියන්දල පදිංචි දේවගේ නොහොත් කත්‍රි ආරච්චිගේ දෝන ජනකදේවි කත්‍රි ආරච්චි සහ බාලසූරියගේ සුජීව ප්‍රියංකර යන අය විසින් පැහැර හැර ඇති හෙයින් ද, 2006 දෙසැම්බර් මස 31 වැනි දිනට එකී දේවගේ නොහොත් කත්‍රිආරච්චිගේ දෝන ජනකදේවි කත්‍රිආරච්චි සහ බාලසූරියගේ සුජීව ප්‍රියංකර යන අයගෙන් ඩීඑෆ්සීසී බැංකුවට රුපියල් පනස් එක් ලක්ෂ හතලිස් දෙදහස් හාරසිය අනූ එකකුත් ශත හැත්තෑවක (රු. 51,42,491.70) මුදලක් සහ 2007 ජනවාරි මස 01 වැනි දින සිට විකිණීමේ දින දක්වා එයින් රුපියල් තිස් හයලක්ෂ හය දහස් හාරසිය හතරකුත් ශත අසූ දෙකක් (රු. 36,06,404.82) සඳහා එක් එක් වර්ෂයේ සෑම හය මසකට වරක් ශ්‍රී ලංකා මහ බැංකුව විසින් ප්‍රතිශෝධනය කර සතිපතා පදනමක් මත පළකරනු ලබන බර තැබූ මධ්‍යක මූලික තැන්පතු පොළී අනුපාතිකයට (ඒ ඩබ්ලිව් ඩී ආර්) වර්ෂයකට සියයට දහයක් (10%) ඉහල අනුපාතිකයක් වන ආසන්නතම ඉහල 0.5% වාර්ෂික අනුපාතිකය ලෙස තීන්දු කරන අනුපාතිකය මත පොළිය ද, රුපියල් හාරලක්ෂ පනස්දහසක් (රු. 4,50,000) සඳහා එක් එක් වර්ෂයේ සෑම තුන් මසකට වරක් ශ්‍රී ලංකා මහ බැංකුව විසින් ප්‍රතිශෝධනය කර සතිපතා පදනමක් මත පළ කරනු ලබන බරතැබූ මධ්‍යක මූලික ණය පොළී අනුපාතිකයට (ඒ ඩබ්ලිව් පී ආර්) වර්ෂයකට සියයට හතක් (7%) ඉහල අනුපාතිකයක් වන ආසන්නතම ඉහල 0.5% වාර්ෂික අනුපාතිකය ලෙස තීන්දු කරන අනුපාතිකය මත පොළිය ද ලැබිය යුතුව හා අයවිය යුතුව ඇති හෙයින් ද,

ඉහත කී උකස් බැඳුම්කරය මත අයවිය යුතු මුදල වන රුපියල් පනස් එක්ලක්ෂ හතලිස් දෙදහස් හාරසිය අනූ එකකුත් ශත හැත්තෑවක (රු. 51,42,491.70) මුදල සහ 2007 ජනවාරි මස 01 වැනි දින සිට විකිණීමේ දින දක්වා එයින් රුපියල් තිස්හය ලක්ෂ හයදහස් හාරසිය හතරකුත් ශත අසූ දෙකක් (රු. 36,06,404.82) සඳහා එක් එක් වර්ෂයේ සෑම හය මසකට වරක් ශ්‍රී ලංකා මහ බැංකුව විසින් ප්‍රතිශෝධනය කර සතිපතා පදනමක් මත පළකරනු ලබන බර තැබූ මධ්‍යක මූලික් තැන්පතු පොළී අනුපාතිකයට (ඒ ඩබ්ලිව් ඩී ආර්) වර්ෂයකට සියයට දහයක් (10%) ඉහල අනුපාතිකයක් වන ආසන්නතම ඉහල 0.5% වාර්ෂික අනුපාතිකය ලෙස තීන්දු කරන අනුපාතිකය මත පොළිය ද, රුපියල් හාරලක්ෂ පනස්දහසක් (රු. 4,50,000) සඳහා එක් එක් වර්ෂයේ සෑම තුන් මසකට වර්ක් ශ්‍රී ලංකා බැංකුව විසින් ප්‍රතිශෝධනය කර සතිපතා පදනමක් මත පළ කරනු ලබන බර තැබූ මධ්‍යක මූලික ණය පොළී අනුපාතිකය (ඒ ඩබ්ලිව් පී ආර්) වර්ෂයකට සියයට හතක් (7%) ඉහල අනුපාතිකයක් වන ආසන්නතම ඉහල 0.5% වාර්ෂික අනුපාතය ලෙස තීන්දු කරන අනුපාතිකය මත පොළිය ද, හෝ විකිණීමේ දිනට එයින් නොගෙවා ඉතිරිව ඇති යම් කොටසක් මීට අදාල ඉඩම හා පරිශ්‍රය සහ එයට හිමි මාර්ග අයිතිය විකිණීම පිළිබඳ ප්‍රචාරක ගාස්තු හා විකිණීමේ ගාස්තු ද, 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 13 වන වගන්තියට අනුව ඉහත කී උකස් බැඳුම්කරවල ප්‍රතිඥාප්තිවලට අනුකූලව ඩීඑෆ්සීසී බැංකුව වැය කර ඇති සියලු මුදල් හා දරා ඇති සියලු වියදම් හා ගාස්තු සමග අයකර ගැනීම සඳහා ඉහත කී අංක 1370 හා 1601 දරන උකස් බැඳුම්කර මගින් ඩීඑෆ්සීසී බැංකුව වෙත උකස් කර තිබෙන මෙහි පහත විස්තර කරන ඉඩම හා පරිශ්‍රය සහ ඊට හිමි මාර්ග අයිතිය ද කොළඹ බලයලත් වෙන්දේසිකාර ෂොක්මන් සහ සමරවික්‍රම මහතුන් ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යැයි 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් සහ සංශෝධිත පරිදි වූ 1955 අංක 35 දරන ලංකා සංවර්ධන මුදල් සංස්ථා පනතින් පැවරී ඇති බලතල යටතේ ඩීඑෆ්සීසී බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය මෙයින් යෝජනා සම්මත කරයි.

**අංක 1370 හා 1601 දරන උකස් බැඳුම්කර මගින් උකස් කරන ලද දේපළ විස්තරය**

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, සල්පිටි කෝරළේ, පල්ලේ පත්තුවේ, තුම්බෝවිල පිහිටි කහටගහලන්ද නමැති ඉඩමේ බලයලත් මිනින්දෝරු පී. ඩබ්. එස්. සී. විතාන විසින් මැන සාදන ලද අංක 1195 හා

2002 ජුනි මස 18 වැනි දින දරන පිඹුරේ දැක්වෙන ලොට් අංක 3ඒ1 ලෙස ලකුණු කළ බෙදා වෙන්කළ බිම් කට්ටිය වන උතුරට : සිලෝන් සෙරමික්ස් ලිමිටඩ් ආයතනයට අයත් පරිශ්‍රය ද, නැගෙනහිරට : අංක 439 දරන පිඹුරේ ලොට් අංක 4 ද, දකුණට : ලොට් අංක 3ඒ2 සහ 3ඒ4 ද, බස්නාහිරට : අංක 439 දරන පිඹුරේ ලොට් අංක 2 ද යන මායිම් ඇතුළත ඉහත කී අංක 1195 දරන පිඹුර ප්‍රකාර පර්චස් විසිපහකුත් දශම හතයි පහක් (අ. 0, රූ. 0, පර්. 25.75) විශාලත්වය ඇති ඉඩම වේ.

මෙයට ඉහත සඳහන් අංක 1195 දරන පිඹුරේ ලොට් අංක 3ඒ4 දරන බිම් කට්ටියෙන් එය මතින් සහ ඔස්සේ මාර්ග අයිතිය ද ඇතුළත් වේ.

ඒ. එන්. ෆොන්සේකා,
අධ්‍යක්ෂ/සාමාන්‍යාධිකාරී.

ඩීඑෆ්සීසී බැංකුව,
අංක 73/5, ගාලු පාර,
කොළඹ 03.

04-347/1

---

## ඩීඑෆ්සීසී බැංකුව

### 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 04 වන වගන්තිය ප්‍රකාර (ලංකා සංවර්ධන මුදල් සංස්ථාව යනුවෙන් කලින් හැඳින්වෙන) ඩීඑෆ්සීසී බැංකුව විසින් සම්මත කරගන්නා ලද යෝජනා සම්මතය පිළිබඳ දැන්වීම

ඩීඑෆ්සීසී බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් මෙහි පහත දැක්වෙන යෝජනා සම්මතය ඒකච්ඡන්දයෙන් සම්මත කර ගන්නා ලද බව 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 8 වන වගන්තියට අනුකූලව මෙයින් දැනුම් දෙනු ලැබේ.

#### අධ්‍යක්ෂ මණ්ඩල යෝජනා සම්මතය

"ලංකා සංවර්ධන මුදල් සංස්ථාව යනුවෙන් කලින් හැඳින්වුණු ඩීඑෆ්සීසී බැංකුව නමට කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් එල්. එස්. ජයසිංහ විසින් ලියා සහතික කරන ලද අංක 335 හා 336 සහ 2004 සැප්තැම්බර් මස 27 දින දරන උකස් බැඳුම්කර දෙක මත අයවිය යුතු මුදල් ගෙවීම "කොස්ගම ෆර්ටිලයිසර්" යන නාමය අභිධානය සහ ආයතනය යටතේ හවුල් ව්‍යාපාරයක් ලෙස ව්‍යාපාරය කරගෙන යන කොස්ගම දෙදෙනාම පදිංචි රාජා ලලිත් තලගල සහ චන්දන ප්‍රේමනාත් මුදුන්කොටුව යන අය විසින් පැහැර හැර ඇති හෙයින් ද, 2006 ජුනි මස 30 වැනි දිනට ඉහත කී අංක 335 හා 336 දරන උකස් බැඳුම්කර මත එකී රාජා ලලිත් තලගල සහ චන්දන ප්‍රේමනාත් මුදුන්කොටුව යන අයගෙන් ඩීඑෆ්සීසී බැංකුවට රුපියල් විසිඑක් ලක්ෂ අසූනව දහස් තිස් දෙකකුත් ශත හතලිස් අටක (රු. 21,89,032.48) මුදලක් සහ 2006 ජුලි මස 01 වැනි දින සිට විකිණීමේ දිනය දක්වා එයින් රුපියල් දහඅටලක්ෂ විසිඑක් දහස් හයසිය හැත්තෑවක් (රු. 18,21,670) සඳහා එක් එක් වර්ෂයේ ජනවාරි, අප්‍රේල්, ජුලි සහ ඔක්තෝබර් මාසවල වැඩකරන ප්‍රථම දිනයේ දී ශ්‍රී ලංකා මහ බැංකුව විසින් ප්‍රතිශෝධනය කර සතිපතා පදනමක් මත පළකරනු ලබන බර තැබූ මධ්‍යක මූලික ණය පොළී අනුපාතිකයට (ඒඩබ්ලිව්පීආර්) වර්ෂයකට සියයට හතකුත් දශම පහක් ඉහල අනුපාතිකයක් වන ආසන්නතම ඉහල 0.5% ලෙස තීන්දු කරන අනුපාතිකය මත පොළිය ද ලැබිය යුතුව හා අයවිය යුතුව ඇති හෙයින් ද,

ඉහත කී උකස් බැඳුම්කර මත අයවිය යුතු මුදල වන රුපියල් විසිඑක් ලක්ෂ අසූනව දහස් තිස් දෙකකුත් ශත හතලිස් අටක (රු. 21,89,032.48) මුදල සහ 2006 ජුලි මස 01 වැනි දින සිට විකිණීමේ දිනය දක්වා එයින් රුපියල් දහඅට ලක්ෂ විසිඑක් දහස් හයසිය හැත්තෑවක් (රු. 18,21,670) සඳහා එක් එක් වර්ෂයේ ජනවාරි, අප්‍රේල්, ජුලි සහ ඔක්තෝබර් මාසවල වැඩකරන ප්‍රථම දිනයේ දී ශ්‍රී ලංකා මහ බැංකුව විසින් ප්‍රතිශෝධනය කර සතිපතා පදනමක් මත පළකරනු ලබන බර තැබූ මධ්‍යක මූලික ණය පොළී අනුපාතිකයට (ඒඩබ්ලිව්පීආර්) වර්ෂයකට සියයට හතකුත් දශම පහක් (7.5 %) ඉහල අනුපාතිකයක් වන ආසන්නතම ඉහල 0.5% ලෙස තීන්දු කරන අනුපාතිකය මත පොළිය හෝ විකිණීමේ දිනට එයින් නොගෙවා ඉතිරිව ඇති යම් කොටසක්, මීට අදාළ ඉඩම හා පරිශ්‍රය සහ ඊට හිමි මාර්ග අයිතිය ද පිරියත, යන්ත්‍ර සූත්‍ර හා උපකරණ ද විකිණීම පිළිබඳ ප්‍රචාරක ගාස්තු හා විකිණීමේ ගාස්තු ද, 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 13 වන වගන්තිය අනුව හා ඉහත කී අංක 335 සහ 336 දරන උකස් බැඳුම්කරවල ප්‍රතිඥප්තිවලට අනුකූලව ඩීඑෆ්සීසී බැංකුව වැය කර ඇති සියලු මුදල් හා දරා ඇති සියලු වියදම් හා ගාස්තු ද සමග අයකර ගැනීම සඳහා ඉහත කී අංක 335 හා 336 දරන උකස් බැඳුම්කර මගින් ඩීඑෆ්සීසී බැංකුව වෙත පිළිවෙලින් උකස් කර තිබෙන මෙහි පහත විස්තර කරන ඉඩම හා පරිශ්‍රය සහ ඊට හිමි මාර්ග අයිතිය ද පිරියත, යන්ත්‍රසූත්‍ර හා උපකරණ ද කොළඹ, බලයලත් වෙන්දේසිකාර ෂොක්මන් සහ සමරවික්‍රම මහතුන් ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යැයි 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් සහ සංශෝධිත පරිදි වූ 1955 අංක 35 දරන ලංකා සංවර්ධන මුදල් සංස්ථා පනතින් පැවරී ඇති බලතල යටතේ ඩීඑෆ්සීසී බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය මෙයින් යෝජනා සම්මත කරයි.".

#### අංක 355 දරන උකස් බැඳුම්කරය මගින් උකස් කරන ලද දේපළ විස්තරය

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, හේවාගම් කෝරළේ, උඩුගහ පත්තුවේ, සීතාවක ප්‍රාදේශීය සභාවේ (හංවැල්ල-උඩුගම පත්තුව උප කාර්යාල) බල ප්‍රදේශ සීමාව ඇතුළත කනම්පැල්ලේ පිහිටි "කනම්පැල්ල ලන්ද" නමැති ඉඩමේ, බලයලත් මිනින්දෝරු කේ. එම්. ඒ. එච්. බණ්ඩාර විසින් මැන සාදන ලද අංක 1329 හා 2003 අගෝස්තු මස 03 වැනි දින දරන පිඹුරේ දැක්වෙන ලොට් අංක 1 ලෙස ලකුණු කළ බෙදා වෙන් කළ බිම් කට්ටිය උතුරට : අංක 596/ඒ දරන පිඹුරේ ලොට් ඒ/4 සහ වරකාවිල කුඹුර ද, නැගෙනහිරට : වරකාවිල කුඹුර සහ අංක 596/ඒ දරන පිඹුරේ ලොට් ඒ/1 ද, දකුණට : අංක 596/ඒ දරන පිඹුරේ ලොට් ඒ/1 සහ ලොට් අංක 2 ද, බස්නාහිරට ලොට් අංක 2, 3 (අඩි 15ක් පළල පාරක් සඳහා වෙන් කළ බිම) සහ අංක 596/ඒ දරන පිඹුරේ ලොට් ඒ/4 ද යන මායිම් ඇතුළත එකී අංක 1329 දරන පිඹුර ප්‍රකාර රූඩ් දෙකක් (අ. 0, රූ. 2, පර්. 0) විශාලත්වය ඇති ඉඩම.

මෙයට ඉහත කී අංක 1329 දරන පිඹුරේ (අඩි 15ක් පළල පාරක් සඳහා වෙන් කළ) ලොට් අංක 3 මතින් මාර්ග අයිතිය ද ඇතුළත් වේ.

ඉහත සඳහන් ලොට් අංක 1 සහ 3 මෙහි පහත විස්තර කරන ඉඩමේ අතුරු බෙදීම් වේ.

ඉහත කී කනම්පැල්ලේ පිහිටි "කනම්පැල්ලලන්ද" නමැති ඉඩමේ, බලයලත් මිනින්දෝරු සී. ඒ. ඥානප්‍රගාසම් විසින් මැන සාදන ලද අංක 596/ඒ හා 1937 අප්‍රේල් මස 22 දින දරන පිඹුරේ දැක්වෙන ලොඒ ඒ/2 ලෙස ලකුණු කළ බෙදා වෙන් කළ බිම් කට්ටිය වන උතුරු-නැගෙනහිරට වරකාවිල කුඹුර ද, දකුණු-නැගෙනහිරට : ලොට් ඒ/1 ද, දකුණු-බස්නාහිරට

: කොස්ගම-පූගොඩ පාර ද, උතුරු-බස්නාහිරට ලොට් ඒ4 ද යන මායිම් ඇතුළත එකී අංක 596/ඒ දරන පිඹුර ප්‍රකාර අක්කර එකකුත් පර්චස් විසිතුනයි දශම තුනයි තුනක් (අ. 1, රූ. 0, පර්. 23.33) විශාලත්වය ඇති ඉඩම සහ එහි පිහිටි ගොඩනැගිලි, වැවිලි, ගසකොළ සහ වෙනත් සියලු දේ.

**අංක 336 දරන උකස් බැඳුම්කරය මගින් උකස් කරන ලද දේපළ විස්තරය**

| *විස්තරය* | *ප්‍රමාණය* |
|---|---|
| මිනි චොපර් මැෂින් | 1 |
| තරාදි (ස්කේල්) | 2 |
| මහන මැෂින් | 1 |

ඒ. එන්. ෆොන්සේකා,
අධ්‍යක්ෂ/සාමාන්‍යාධිකාරී.

ඩීඑෆ්සීසී බැංකුව,
අංක 73/5, ගාලු පාර,
කොළඹ 3.

04-347/2

---

**ලංකා බැංකුව**

**1968 අංක 34 දරන පනතින් හා 1974 අංක 10 දරන නීතියෙන් සංශෝධනය කරන ලද ලංකා බැංකු ආඥාපනතේ (397 අධිකාරය) 21 වෙනි වගන්තිය යටතේ දැන්වීම**

2004.03.29 වෙනි දින පවත්වන ලද රැස්වීමකදී මෙම බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් විශේෂයෙන්ම හා ඒකමතිකව පහත සඳහන් පරිදි යෝජනා සම්මත කරගන්නා ලදී :

"1. මහජන නොතාරිස් ඩබ්. එම්. එම්. සියාඩ් විසින් සහතික කරන ලද 1998.01.16 දිනැති අංක 78 හා මහජන නොතාරිස් ජී. ද අල්විස් විසින් සහතික කරන ලද 1996.08.20 දිනැති උකස් බැඳුම්කර අංක 427 හා එස්. ආර්. ද සිල්වා විසින් සහතික කරන ලද 1997.10.20 දිනැති අංක 1766 දරන උකස් බැඳුම්කරය මත අයිරා ගිණුම් මත මුල් මුදල හා 2008.02.29 දින තෙක් පොලිය වශයෙන් රුපියල් හතලිස් හය ලක්ෂ දස දහස් නවසිය විසිපහයි ශත විසි දෙකක (රු.46,10,925.22) මුදලක් සමඟ අයිරා ගිණුම මත රුපියල් දාහතර ලක්ෂයක (රු.14,00,000) මුදලක් මත වසරකට සියයට විසිදෙකයි දශම පහ (22.5%) බැගින් පොලියක්, 2008.03.01 වෙනි දින සිට ගෙවීම නිම කරන දිනය තෙක් හෝමාගම, ගලවිලවත්ත, සමන් මාවත, අංක 6 හි පදිංචි එඩ්ගාර් ද අල්විස් මහතා, මල්වත්ත හෙට්ටිආරච්චිගේ රවීන් ප්‍රසන්න ද අල්විස් මහතා සහ සුජාතා පද්මිණී ද අල්විස් මහත්මිය යන අයගෙන් අයවිය යුතුව ඇත.

2. එකී අංක 78,427,1766 දරන උකස් බැඳුම්කර මත අයවිය යුතු ඉහත 1 හි සඳහන් මුදල සමඟ විකිණීමේ දිනය තෙක් ඉහත කී ආකාරයට අයවිය යුතු පොලියද, ලංකා බැංකු ආඥා පනතේ 26 වෙනි වගන්තිය යටතේ අයකර ගත හැකි ගාස්තු සහ මුදල් ද අයකර ගැනීම පිණිස ලංකා බැංකුව වෙත උකස් කරනු ලැබ මෙහි පහත විස්තර කොට ඇති දේපල ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීමට කොලොන්නාව, විහාර මාවත, අංක 50/3 හි පදිංචි වෙන්දේසිකාර ටී ඇන්ඩ් එච් වෙන්දේසිකාර මහතුන්ට එකී ලංකා බැංකු ආඥාපනතේ (397 අධිකාරය) හා එහි සංශෝධනවල 19 වෙනි වගන්තිය යටතේ මෙයින් අවසර දී බලය පවරනු ලැබේ.".

**උපලේඛනය**

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, හේවාගම් කෝරලයේ, පල්ලේපත්තුවේ, හෝමාගම නගර සභා සීමාවේ හෝමාගම, සමන් මාවත හි පිහිටි සමන් මාවත වරිපනම් අංක 6 දරන ගලවිල එස්ටේට් නමැති ඉඩමෙන් බලයලත් මිනින්දෝරු එම්. ජේ. සේතුංග විසින් සාදන ලද 1971 දෙසැම්බර් 21 දිනැති අංක 992බී දරන පිඹුරේ විස්තර කළ ලොට් 13 වශයෙන් සඳහන් බෙදන ලද්දාවූ නිශ්චිත ඉඩම් කැබැල්ල උතුරට : ලොට් 12 ද, නැගෙනහිරට : ලොට් 11 ද, දකුණට : ගලවිල එස්ටේට් හි කොටසක් ද, බස්නාහිරට : බලයලත් මිනින්දෝරු වී. ඒ. එල්. සේනාරත්න විසින් සාදන ලද 1964 මාර්තු 16 දිනැති අංක 2898 දරන පිඹුරේ ලොට් ඒ ද, මායිම්ව පර්චස් විසිහතරයි දශම පහක (අ. 0, රූ. 0, පර්. 24.5) බිම් ප්‍රමාණයකින් යුක්ත වේ. මෙය හෝමාගම ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ජී495/64 හි ලියාපදිංචි කර ඇත.

තවද, බලයලත් මිනින්දෝරු වී. ඒ. එල්. සේනාරත්න විසින් සාදන ලද 1964 මාර්තු 16 දිනැති අංක 2898 දරන පිඹුරේ විස්තර කළ ලොට් ඒ වශයෙන් සඳහන් (පාර සඳහා වෙන්කළ) ඉඩම් කැබැල්ල මත පාරේ අයිතිය ද වේ. මෙය හෝමාගම ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ජී876/292 හි ලියාපදිංචි කර ඇත.

සී. ඩබ්. වෙලගෙදර,
ප්‍රධාන කළමනාකරු.

ලංකා බැංකුව,
අධිශ්‍රේණිය ශාඛාව,
නුගේගොඩ.

04-344

---

**ලංකා බැංකුව**

**1968 අංක 34 දරන පනතින් හා 1974 අංක 10 දරන නීතියෙන් සංශෝධනය කරන ලද ලංකා බැංකු ආඥාපනතේ (397 අධිකාරය) 21 වෙනි වගන්තිය යටතේ දැන්වීම**

2007.12.13 වෙනි දින පවත්වන ලද රැස්වීමකදී මෙම බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් විශේෂයෙන්ම හා ඒකමතිකව පහත සඳහන් පරිදි යෝජනා සම්මත කරගන්නා ලදී :

"1. මහජන නොතාරිස් ජී. එස්. එම්. සමරකෝන් විසින් පිළිවෙලින් සහතික කරන ලද 1993.10.27 සහ 1994.11.30 දිනැති අංක 1074 හා 2225 සහ මහජන නොතාරිස් එම්. ඩී. මුණසිංහ විසින් සහතික කරන ලද 1991.02.07 දිනැති අංක 450 දරන බැඳුම්කර මත මුල් මුදල හා 2007.09.30 දින තෙක් පොලිය වශයෙන් රුපියල් තුන්ලක්ෂ පනස් හය දහස් තුන්සිය අටයි ශත විසිපහක (රු.3,56,308.25) මුදලක් සමඟ රුපියල් අනූහය දහස් හයසිය හැටක් (රු.96,660) රුපියල් විසි අට දහස් හාරසිය හතලිස් හතයි ශත තිස් නවයක් (රු.28,447.39) සහ රුපියල් එක්ලක්ෂ හැත්තෑහය දහස් තුන්සිය අසූහතයි ශත විසිහයක (රු.1,76,387.26) මුදලක් මත පිළිවෙලින් වසරකට සියයට දහඅට (18%) සියයට පහ (5%) සහ සියයට අට (8%) බැගින් පොලියක්, 2007.10.01 වෙනි දින සිට ගෙවීම නිම කරන දිනය තෙක් දිවුලපිටිය, ජයකොඩි පෙදෙස, අංක 2 හි පදිංචි වදුරුවලගේ වොලී ප්‍රනාන්දු මහතාගෙන් අයවිය යුතුව ඇත.

2. එකී අංක 450,1074 සහ 2225 දරන බැඳුම්කර මත අයවිය යුතු එකී රුපියල් තුන්ලක්ෂ පනස් හය දහස් තුන්සිය අටයි ශත විසිපහක (රු.3,56,308.25) මුදල සමග 2007.10.01 වෙනි දින සිට විකිණීමේ දිනය තෙක් ඉහත කී ආකාරයට අයවිය යුතු පොලියද, ලංකා බැංකු ආඥාපනතේ 26 වෙනි වගන්තිය යටතේ අයකර ගතහැකි ගාස්තු සහ මුදල්ද, අයකරගැනීම පිණිස ලංකා බැංකුව වෙත උකස් කරනු ලැබ මෙහි පහත විස්තර කොට ඇති දේපල ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීමට කෝට්ටේ, පිටකෝට්ටේ, අංක 474 හි මහානාම ඩ්‍රයිව් හි පදිංචි වෙන්දේසිකාර රංජිත සිරිවර්ධන මහානාම මහතාට එකී ලංකා බැංකු ආඥාපනතේ (397 අධිකාරය) හා එහි සංශෝධනවල 19 වෙනි වගන්තිය යටතේ ද, ලංකා බැංකු ආඥාපනතේ 21 වෙනි වගන්තිය යටතේ මෙම යෝජනාවේ දැන්වීම පළ කිරීමට ලංකා බැංකුවේ දිවුලපිටිය ශාඛා කළමනාකරුටද මෙයින් අවසර දී බලය පවරනු ලැබේ.".

**විකිණීමට ඇති දේපළ**

**පළමුවන උපලේඛනය**

1. බස්නාහිර පළාතේ, මීගමුව ලියාපදිංචි කොට්ඨාසයේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, අලුත්කුරු කෝරලයේ, දූනගහපත්තුවේ, කැළැපිටිමුල්ල ග්‍රාමයේ පිහිටි විනිප්‍රඩ් එස්ටේට් නමැති ඉඩමෙන් ලොට් 22, වශයෙන් සඳහන් ඉඩම් කැබැල්ල උතුරට ඃ එම ඉඩමේ ලොට් 23 ද, නැගෙනහිරටඃ කේ . විමලසේන ගේ ඉඩමද, දකුණට ඃ මීගමුව සිට දිවුලපිටිය දක්වා මහා මාර්ගය ද, බස්නාහිරට ඃ අඩි 20ක් පළල වෙන් කළ පාර වශයෙන් සඳහන් ලොට් 45 ද, මායිම්ව බලයලත් මිනින්දෝරු වෝල්ටර් ඒ. ප්‍රනාන්දු විසින් සාදන ලද 1980 ඔක්තෝබර් 09 දිනැති අංක 3198 දරන පිඹුර අනුව ගහකොළ වැවිලි සහ පිහිටි සියලු දේ වේ. මෙය මීගමුව ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ඊ 662/66හි ලියාපදිංචි කර ඇත.

2. එකී කැලැපිටමුල්ල ග්‍රාමයේ පිහිටි විනිප්‍රඩ් එස්ටේට් නමැති ඉඩමෙන් ලොට් 23 වශයෙන් සඳහන් ඉඩම් කැබැල්ල උතුරට එම ඉඩමේ ලොට් 24 ද, නැගෙනහිරට කේ. විමලසේනගේ ඉඩම ද, දකුණට එම ඉඩමේ ලොට් 22 ද, බස්නාහිරට අඩි 20ක් පළල පාරක් වූ එම ඉඩමේ ලොට් 45 ද, මායිම්ව එකී අංක 3198 දරන පිඹුර අනුව පර්චස් විස්සක (අ. 0, රූ. 0, පර්. 20) බිම් ප්‍රමාණය සමඟ එහි පිහිටි ගහකොළ වැවිලි සහ සියලු දේ වේ. මෙය මීගමුව ඉඩමේ ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ඊ662/67 හි ලියාපදිංචි කර ඇත.

3. එකී කැලැපිටිමුල්ල ග්‍රාමයේ පිහිටි විනිප්‍රඩ් එස්ටේට් නමැති ඉඩමෙන් ලොට් 24 වශයෙන් සඳහන් ඉඩම් කැබැල්ල උතුරට එම ඉඩමේ ලොට් 25 ද, නැගෙනහිරට කේ. විමලසේනගේ ඉඩමද, දකුණට එම ඉඩමේ ලොට් 23 ද, බස්නාහිරට අඩි 20ක් පළල පාරක් සඳහා වෙන්කළ එම ඉඩමේ ලොට් 45 ද, මායිම්ව එකී අංක 3198 දරන පිඹුර අනුව පර්චස් විස්සක් (අ. 0, රූ. 0, පර්. 20) බිම් ප්‍රමාණය සමඟ ගහකොළ වැවිලි සහ පිහිටි සියලු දේ වේ. මෙය මීගමුව ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ඊ 662/68 හි ලියාපදිංචි කර ඇත.

**දෙවන උපලේඛනය**

4. එකී කැලැපිටිමුල්ල ග්‍රාමයේ පිහිටි විනිප්‍රඩ් එස්ටේට් නමැති ඉඩමේ ලොට් 45 (අඩි 20ක් පළල පාරක් සඳහා වෙන්වූ ) වශයෙන් සඳහන් ඉඩම් කැබැල්ල උතුරට එම ඉඩමේ ලොට් 35 ද, නැගෙනහිරට එම ඉඩමේ ලොට් 22 සිට 34 දක්වා ද, දකුණට මීගමුව සිට දිවුලපිටිය දක්වා මහා මාර්ගය ද, බස්නාහිරට එම ඉඩමේ ලොට් 15 සිට 21 දක්වා ද, එම ඉඩමේ ලොට් 43 සහ 42 ද, එම ඉඩමේ ලොට් 38 සහ 39 ද මායිම්ව එකී අංක 3198 දරන පිඹුර අනුව රූඩ් එකයි පර්චස් විස්සක (අ. 0, රූ. 01, පර්. 20) ප්‍රමාණයෙන් යුක්තවේ. මෙය මීගමුව ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ඊ 662/228 හි ලියාපදිංචි කර ඇත.

එම්. වීරසිංහ,
කළමනාකරු.

ලංකා බැංකුව,
දිවුලපිටිය ශාඛාව.

04-345

---

**ලංකා බැංකුව**

1968 අංක 34 දරන පනතින් හා 1974 අංක 10 දරන නීතියෙන් සංශෝධනය කරන ලද ලංකා බැංකු ආඥාපනතේ (397 අධිකාරය) 21 වෙනි වගන්තිය යටතේ දැන්වීම

2005.03.03 වෙනි දින පවත්වන ලද රැස්වීමකදී මෙම බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් විශේෂයෙන්ම හා ඒකමතිකව පහත සඳහන් පරිදි යෝජනා සම්මත කරගන්නා ලදී ඃ

"1. මහජන නොතාරිස් ඩබ්. ඒ. එස්. සී. මැතිව් විසින් සහතික කරන ලද 1996.05.08 දිනැති අංක 1610 දරන උකස් බැඳුම්කරය මත අයිරාව මත මුල් මුදල හා 2008.02.29 දින තෙක් පොළිය වශයෙන් රුපියල් හතලිස් හතර ලක්ෂ විසිපන්දහස් නවසිය අසූනවයයි ශත හැත්තෑහයක (රු. 44,25,989.76)ක මුදලක් සමඟ අයිරා ගිණුම මත රුපියල් දහතුන් ලක්ෂ විසිහතර දහස් දෙසිය දහඅටයි ශත හැටක (රු. 3,24,218.60) මුදලක් මත වසරකට සියයට විසිදෙකයි දශම පහ (22.5%) බැගින් පොලියක්, 2008.03.01 වෙනි දින සිට ගෙවීම නිම කරන දිනය තෙක් හෝමාගම, ගලවිලවත්ත, සමන් මාවත, අංක 3හි පදිංචි රැපිඩ් ට්‍රාන්ස් සමාගමෙන් අයවිය යුතුව ඇත.

2. එකී අංක 1610 දරන උකස් බැඳුම්කරය මත අයවිය යුතු ඉහත "1" හි සඳහන් මුදල සමග විකිණීමේ දිනය තෙක් ඉහත කී ආකාරයට අයවිය යුතු පොලියද, ලංකා බැංකු ආඥාපනතේ 26 වෙනි වගන්තිය යටතේ අයකර ගතහැකි ගාස්තු සහ මුදල්ද, අයකරගැනීම පිණිස ලංකා බැංකුව වෙත උකස් කරනු ලැබ මෙහි පහත විස්තර කොට ඇති දේපල ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීමට කොලොන්නාව, විහාර මාවත, අංක 50/3හි පදිංචි වෙන්දේසිකාර ටී ඇන්ඩ් එච් වෙන්දේසිකාර මහතුන්ට එකී ලංකා බැංකු ආඥාපනතේ (397 අධිකාරය) හා එහි සංශෝධනවල 19 වෙනි වගන්තිය යටතේ මෙයින් අවසර දී බලය පවරනු ලැබේ.

**උපලේඛනය**

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, හේවාගම් කෝරළයේ, පල්ලේ පත්තුවේ, හෝමාගම ප්‍රාදේශීය සභා සීමාවේ හෝමාගම හි පිහිටි සමන් මාවත, වරිපනම් අංක 3 දරන ගලවිල එස්ටේට් නමැති ඉඩමෙන් බලයලත් මිනින්දෝරු ටී. කේ. එස්. ජයරත්න විසින් 1996.01.02 දින තහවුරු කරන ලද හා බලයලත් මිනින්දෝරු වී. ඒ. එල්. සේනාරත්න විසින් සාදන ලද 1964 මාර්තු 16 දිනැති අංක 2898 දරන පිඹුරේ විස්තර කළ ලොට් 30 වශයෙන් සඳහන් බෙදන ලද්දාවූ නිශ්චිත ඉඩම් කැබැල්ල උතුරට ඃ ලොට් 35 ද, නැගෙනහිරට ඃ ලොට් ඒ ද, දකුණට ඃ ලොට් බී ද, බස්නාහිරට ඃ ලොට් 29 ද මායිම්ව එකී අංක 2898 දරන පිඹුර අනුව පර්චස් විස්සක (අ. 0, රූ. 0, පර්. 20) බිම් ප්‍රමාණය සමඟ ගහකොළ, වැවිලි, ගොඩනැගිලි සහ වැවෙන දේද වේ. මෙය හෝමාගම ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ජී 762/177හි ලියාපදිංචි කර ඇත.

තවද, එකී අංක 2898 දරන පිඹුරේ විස්තර කළ ලොට් ඒ සහ ජේ වශයෙන් සඳහන් ඉඩම දිගේ හා ඒ මත පාරේ අයිතිය ද වේ.

සී. ඩබ්. වෙලගෙදර,
ප්‍රධාන කළමනාකරු.

ලංකා බැංකුව,
අධිශ්‍රේණි ශාඛාව,
නුගේගොඩ.

04-343

---

## කොමර්ෂල් බෑන්ක් ඔෆ් සිලෝන් ලිමිටඩ්

### 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 04 වන වගන්තිය යටතේ කොමර්ෂල් බෑන්ක් ඔෆ්ප් සිලෝන් ලිමිටඩ් හි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කරගනු ලැබූ යෝජනා සම්මුතිය

ගිණුම් අංකය : 1360000011.

2004 අගෝස්තු මස 27 වන දින පවත්වන ලද කොමර්ෂල් බෑන්ක් ඔෆ් සිලෝන් ලිමිටඩ් හි අධ්‍යක්ෂ මණ්ඩලයේ රැස්වීමේදී මතු දැක්වෙන යෝජනාව විශේෂයෙන්ම සහ ඒකච්ඡන්දයෙන් සම්මත කරගන්නා ලදී.

"කළුතර ප්‍රසිද්ධ නොතාරිස් ආර්. කුරේ විසින් සහතික කරන ලද්දාවූ ද, කොමර්ෂල් බෑන්ක් ඔෆ් සිලෝන් ලිමිටඩ් හි නමට ලියන ලද්දාවූ ද 2001 සැප්තැම්බර් මස 20 වන දින හා අංක 2238 සහ 2002 ජනවාරි මස 3 වන දින හා අංක 2257 දරන බැඳුම්කර යටතේ අයවිය යුතු මුදල් ගෙවීම "පෙපර් කෝන්" යන නාමය සහ විලාශය යටතේ වෙළඳ ව්‍යාපාරයක් පවත්වාගෙන යන කෝරළේ ලියනගේ රංජිත් කුමාර ණයකරු හැටියට ද, පැහැර හැර ඇති හෙයින් එකී බැඳුම්කර යටතේ රුපියල් එකොලොස් ලක්ෂ විසි නව දහස් එකසිය හැත්තෑ හයයි ශත විසි නවයක (රු.11,29,176.29) මුදලක් 2004 ජූලි මස 25 වන දින වන විට කොමර්ෂල් බෑන්ක් ඔෆ්ප් සිලෝන් ලිමිටඩ් ට අයවිය යුතුව සහ ලැබිය යුතුව ඇති හෙයින් එකී රුපියල් එකොලොස් ලක්ෂ විසි නව දහස් එකසිය හැත්තෑ හයයි ශත විසි නවයක (රු.11,29,176.29) මුදලට 2004 ජූලි මස 26 වන දින සිට දේපළ විකිණීමේ දිනය දක්වා කාලයට රු.9,29,443.89 ක මුදල සඳහා 14%ක වැඩිදුර වාර්ෂික පොලිය සහ රු.24,604.96 ක මුදල සඳහා 20%ක වැඩිදුර වාර්ෂික පොලිය ද, ප්‍රචාරක වියදම් සඳහා දරන වියදම් සහ වෙනත් ගාස්තු සහ මුදල් ප්‍රමාණයන් ද, තදනන්තරව ගෙවන ලද යම් මුදලක් වේ නම් ඒ මුදලත් අඩුකොට එකී අංක 2238 සහ 2257 දරන උකස් බැඳුම්කර මගින් කොමර්ෂල් බෑන්ක් ඔෆ් සිලෝන් ලිමිටඩ් වෙත උකස්කොට ඇත්තාවූ ද, මෙහි පහත උපලේඛනයේ සවිස්තරව විස්තර කර ඇත්තාවූ ද, දේපල සහ පරිශ්‍රය කොළඹ 12, හල්ස්ඩෝප් වීදියේ අංක 99 හි බලයලත් වෙන්දේසිකරු එල්. බී. සේනානායක මහතා ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යැයි 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් පවරා ඇති බලතල යටතේ කොමර්ෂල් බෑන්ක් ඔෆ් සිලෝන් ලිමිටඩ් හි අධ්‍යක්ෂ මණ්ඩලය මේ මගින් යෝජනා සම්මත කරගනී.".

#### උපලේඛනය

කළුතර බලයලත් මානක බී. කේ. පී. ඩබ්ලිව්. ගුණවර්ධන විසින් 2001 ජූනි මස 29 වන දින සාදන ලද අංක 1066 දරන පිඹුර පරිදි (මෙය කළුතර බලයලත් මානක ඩී. බී. රාජපක්ෂ විසින් 1948 දෙසැම්බර් මස 1 වන දින හා අංක 2131 දරන පිඹුරේ ලොට් 2 වශයෙන් හිමිකම් පෑ සහ කළුතර දිසා අධිකරණයේ අංක 26820 දරන නඩුවේ වාර්තා ගත වූ) බස්නාහිර පළාතේ, කළුතර දිස්ත්‍රික්කයේ, ඉද්දගොඩ පත්තු පස්දුන් කෝරළේ දොඩන්ගොඩ පිහිටි පුහඹුගොඩලන්ද හෙවත් ජම්බෙගොඩලන්ද ලොට් 5 කියන ඉඩමේ බෙදා වෙන්කරන ලද ලොට් "ඒ" දරන ඉඩමට මායිම් උතුරට : එම ඉඩමේ ලොට් 1 සහ 3 සහ සුදුවිකුඹුර ද, නැගෙනහිරට : සුදුවිකුඹුර ද, දකුණට : එම ඉඩමේ ලොට් 6 ද සහ බස්නාහිරට : පාර සහ එම ඉඩමේ ලොට් 3 ද, යන මායිම් තුළ රූඩ් තුනයි පර්චස් දොළහයි දශම බිංදුවයි අටක් (අ. 0, රූ. 3, පර්. 12.08) විශාල ඉඩම එහි තුළ පිහිටි ගහකොළ, වගාවන්, ගොඩනැගිලි සහ සියළු දේත් සමග වන අතර ශ්‍රී දේවානන්ද මාවතේ සිට ඉහත කී පරිශ්‍රයන් වෙත ලගාවීමේ අයිතියද සමඟ වේ. මෙය මතුගම දිස්ත්‍රික් ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ 266 වෙළුමේ 69 වැනි පිටුවේ සී කොට්ඨාසයේ ලියාපදිංචිව ඇත.

ආර්. ආර්. දුනුවිල මහත්මිය,
සමාගම් ලේකම්.

04-339

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.